**ශීර්ෂය 225 - පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 225- පොලිස් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 03 දින පොලිස්පතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 57,868.94 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 54,224.02 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,644.92 ක් හෙවත් සියයට 6.30 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 52,329.15 | 51,343.70 | 985.45 | 1.88 |
| මූලධන | 5,539.79 | 2,880.32 | 2,659.47 | 48.01 |
| **එකතුව** | **57,868.94** | **54,224.02** | **3,644.92** | **6.30** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 1,687.08 | 1,005.08 | 1,387.08 | 1,609.11 | 4,000.00 | 1,759.85 |

## 2.3 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0031/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 51.60 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 5 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 296.4 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත්ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0062/000 | 4.75 |
| 6000/0000/00/0002/0080/000 | 0.04 |
| 6000/0000/00/0013/0050/000 | 34.40 |
| 6000/0000/00/0016/0032/000 | 255.06 |
| 6000/0000/00/0018/0040/000 | 2.19 |
| **එකතුව** | **296.24** |

## 2.5 විගණන නිරීක්ෂණය

පොලිස් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.500,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම

2015 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණු රු.614,760 ක අත්තිකාරම්වලින් 2016 ඔක්තෝබර් 14 දින වන විටත් රු.435,510 ක් පියවා නොතිබුණි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.5,794,934 ක් වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා ලබා දී තිබුණු එකතුව රු.1,386,651 කින් රු.181,800 ක අදාළ කාර්යයන් ඉටු නොකර 2016 ඔක්තෝබර් 14 දින වන විටත් තැනපත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට රු.338,254 ක් වූ නිකුත්කළ නමුත් අවලංගු කල චෙක්පත් 6 කින් රු.218,803 ක් වූ චෙක්පතක් 2016 ඔක්තෝබර් 14 දින වන විටත් තැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණු එකතුව රු.479,316 ක් වූ මුද්දර බදුවලින් රු.187,325 ක් 2016 ඔක්තෝබර් 14 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.133,676,044 ක් වූ අතර, 2016 සැප්තැම්බර් 30 දින වන විට එම මුදල රු.128,043,755 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම අනුව දෙපාර්තමේන්තු පාලන ගිණුමේ හා කොට්ඨාශ කාර්යාල විසින් පිළියෙල කරනු ලැබූ කේවල ශේෂ වර්ගීකරණය අතර රු.3,935,763 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි.

(ඇ) මඩකලපු කොට්ඨාශයේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් රු.211,794 ක් වැඩිපුර අයකර ගෙන තිබුණත්, එම මුදල් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පොලිස් දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

පොලිස් දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2016 අගෝස්තු 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ඇ) බැරකම්**

මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවී සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.7,833,283 ක් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

**3.8 කාර්යසාධනය**

2015 වර්ෂයේ පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ග්‍රහන අපරාධ**

ශ්‍රී ලංකාව තුළ 2013, 2014 හා 2015 වර්ෂවලට අදාළව ග්‍රහන අපරාධ පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

| | 2015 | 2014 | 2013 |
|---|---|---|---|
| වාර්තා වූ අපරාධ ගණන | 40,188 | 50,962 | 55,349 |
| විසඳූ අපරාධ ගණන | 13,049 | 29,396 | 32,791 |
| නොවිසඳූ අපරාධ ගණන | 27,139 | 21,566 | 22,558 |
| විසඳූ අපරාධ වාර්තා වූ අපරාධ ගණනේ ප්‍රතිශතයක් ලෙස | 32.47 | 57.68 | 59.24 |
| නොවිසඳූ අපරාධ වාර්තා වූ අපරාධ ගණනේ ප්‍රතිශතයක් ලෙස | 67.53 | 42.32 | 40.76 |

ඒ ඒ වර්ෂවල විසඳී නොමැති පැමිණිලි සම්බන්ධ තොරතුරු ඉදිරියට ගෙන ඒමේ ක්‍රමවේදයන් නොතිබුණු බැවින් 2015 දෙසැම්බර් 31 දින වන විට සත්‍ය වශයෙන් විසඳීමට නොහැකි වූ පැමිණිලි සංඛ්‍යාව ලබා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂවලට අදාළව නොවිසඳී ඇති අපරාධ සම්බන්ධව පසු විපරම් ක්‍රියාවලියද දුර්වල වී තිබුණි.

## (ආ) රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව

ශ්‍රී ලංකාව තුළ 2014 හා 2015 වර්ෂවලට අදාළව වාර්තා වූ මාර්ග අනතුරු පිළිබඳ සමාලෝචනය පහත දැක්වේ.

| | 2015 | 2014 |
|---|---|---|
| මාරක අනතුරු සංඛ්‍යාව | 2,590 | 2,261 |
| බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව | 7,719 | 6,847 |
| සුළු තුවාල අනතුරු සංඛ්‍යාව | 13,095 | 12,950 |
| අලාභ අනතුරු සංඛ්‍යාව | 13,514 | 13,992 |
| **මුළු අනතුරු සංඛ්‍යාව** | **36,918** | **36,050** |

2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේදී මාරක රිය අනතුරු හා බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව සැලැකිය යුතු මට්ටමකින් වැඩි වී තිබුණි.

## (ඇ) නීති විරෝධි නිද්‍රාජනක ද්‍රව්‍ය වාර්තා වීම්, අත්අඩංගුවට ගැනීම් සහ නඩු පැවරීම්

දිවයින තුළ නීති විරෝධි නිද්‍රාජනක ද්‍රව්‍ය (හෙරොයින්, ගංජා, අබිං, හෂිස්, කොකේන්, වෙනත්) ශ්‍රී ලංකා පොලිසිය සහ විශේෂ කාර්ය බලකාය එක්ව අත්අඩංගුවට ගැනීම් සහ නඩු පැවරීම් සම්බන්ධ පසුගිය වර්ෂ 3 ක දත්ත පහත දැක්වේ.

| වර්ෂය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | වාර්තා වූ අවස්ථා ගණන | නඩු පැවැරූ අවස්ථා ගණන | වාර්තා වීම් තුලින් නඩු පැවරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 2013 | 10,837 kg<br>2777 g<br>1800mg | 73,383 | 70,678 | 96.31 |
| 2014 | 11,117 kg<br>1522 g<br>3012 mg | 74,366 | 71,712 | 96.43 |
| 2015 | 13,548 kg<br>2435 g<br>2686 mg | 89,996 | 87,846 | 97.61 |

මේ අනුව දිවයින තුළ නීති විරෝධී නිද්‍රාජනක ද්‍රව්‍ය භාවිතය වර්ධනය වී තිබුණු බව 2013, 2014 සහ 2015 වර්ෂවල අත්අඩංගුවට ගත් නිද්‍රාජනක ද්‍රව්‍ය ප්‍රමාණයෙන් නිරීක්ෂණය විය.

## 3.9 අනාර්ජීක ගනුදෙනු

----------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.13,245,717 ක් වැනි ඉතා ඉහල වටිනාකමකින් යුතු මෝටර් වාහන සෝදිසි කිරීමේ උපකරණ කට්ටල 08 ක් වර්ෂ 08 කට පමණ පෙර රු.13,245,717 ක් වැය කර මිලදී ගෙන තිබුණි. එම උපකරණ කිසිදු කාර්යයකට නිකුත් කිරීමෙන් තොරව මිලදී ගත් ආකාරයෙන්ම කොටහේන පොලිස්පති ගබඩාවේ රඳවා නොතිබුණි.

(ආ) උප පොලිස් පරීක්ෂකවරුන් හා පොලිස් පරීක්ෂකවරුන් වෙත ලබා දීම සඳහා 2014 වර්ෂයේදී රු.2,000,000 ක් වැය කර ඇඳුම් රඳවන 1000 ක් මිලදී ගෙන තිබුණි. මහර පොලිස් ගබඩාවේ රඳවා තිබූණු එම ඇඳුම් රඳවන බොහෝමයක් ගුණාත්මක භාවයෙන් ඉතා අඩු බාල වර්ගයේ දැව වර්ග යොදා සකස් කර තිබුණු හෙයින් එම ඇඳුම් රඳවන බොහෝමයක් ගුල්ලන් වැනි කෘමි සතුන් විසින් හානි කර තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවේ පිරිවිතරයන් අනුව වර්ෂයක වගකීම් කාලයක් සහිතව මිල ගණන් කැඳවා තිබුණි. විගණන දිනය වූ 2015 අගෝස්තු 16 දින වන විට වගකීම් කාලයෙන් අඩක් ඉක්මවා තිබුණද, එම රඳවන විශාල සංඛ්‍යාවක් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී මිලදී ගැනීමට කටයුතු කළ රු.9,900,000 ක් වූ නිල ඇඳුම් (සුදු) රෙදි මීටර් 30,000 ක් 2014 වර්ෂයේදී කොටහේන පොලිස්පති ගබඩාවට ලැබී තිබුණි. එම ගබඩාවේ එදින වන විටත් රෙදි මීටර් 1468 ක ශේෂයක් පැවැතුණි. එම නිල ඇඳුම් (සුදු) රෙදි නිකුත් කිරීම ඉතා සෙමින් සිදු වී තිබුණි. කෙසේ වුවද 2015 සැප්තැම්බර් 22 දින වන විට මීටර් 21,577.92 රෙදි තොගයක් ගබඩාවේ පැවැතුණි. 2014 වර්ෂයේ නිකුත් කිරීම් හා 2015 සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ රෙදි නිකුත් කිරීම් අනුව 2015 සැප්තැම්බර් 22 දින වන විට පැවැති රෙදි තොගය නිකුත් කර අවසන් කිරිමට ඉදිරි වර්ෂ 04 ක් පමණ කාලයක් ගත වන බව නිරීක්ෂණය විය. තවද ඉතිරි රෙදි තොග පොලිස්පති ගබඩාවේ කුණු දූවිලි සහිත පරිශ්‍රයක අසුරා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරින් සඳහා දැව ඇඳන් 1,000 ක් මිලදී ගැනීම සඳහා ගෙවීම් වවුචර් 07 ක් මගින් පුද්ගලික ආයතනයක් වෙත රු.6,373,874 ක් ගෙවා තිබුණි. එම මිලදී ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ලී ඇඳන් මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබුණි.

(iii) තාක්ෂණික පිරිවිතරය අසම්පූර්ණ ලෙස පිළියෙල කර තිබුණි.

(iv) ලංසුකරු තෝරාගත් පසුව ඉදිරිපත් කර තිබූ පිරිවිතර නැවත සංශෝධනය කර දැව ඇඳන් මිලදී ගෙන තිබුණි.

(v) ඇඳන් නිෂ්පාදනය කර තිබූ දැව පදම් කිරීම / දැව ආරක්ෂකයේ ගුණාත්මකභාවය පිළිබඳ සහතිකයක් ලබාගෙන නොතිබුණි.

**3.10** **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී දේශන ශාලා පුටු 60 ක් රු.231,000 කට මිලදී ගෙන තිබුණි. දෙපාර්තමේන්තු පිරිවිතර පත්‍රිකාවට අමුණා තිබූ ඡායාරූපයට අනුව දේශන ශාලා පුටු වම් පස අත් රඳවන සහිත වේවැල් පුටු විය යුතු වුවත්, මිලදී ගෙන තිබුණු පුටුවල වම්පස අත් රඳවන නොතිබුණු අතර වාඩිවන කොටස ලී පටිවලින් නිමකර තිබුණි.

(ආ) නුවරඑළිය නගරයේ ඉදිකර තිබුණු පොලිස් පරීක්ෂක නිලධාරීන්ගේ සංචාරක නිවස්නය සඳහා පුද්ගලික ආයතනයකින් රු.1,425,350 ක් වූ තිරරෙදි වර්ග මීටර් 4915 ක් මසා සවිකර ගෙන තිබුණද ගිවිසුම් ප්‍රකාරව විශේෂඥ ආයතනයකින් ගුණාත්මකභාවය පිළිබඳ සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(ඇ) තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ නොසලකා හරිමින් පොලිස් දෙපාර්තමේන්තුවට 2014 වර්ෂයේදී එකක් රු.14,990 ක් බැගින් කෑම තබන දැව අල්මාරි 100 ක් රු.1,499,000 කට මිලදී ගෙන තිබුණි. 2015 සැප්තැම්බර් 30 දින වන විටත් එම අල්මාරි ගුල්ලන් සහ දැව විනාශ කරන කෘමි සතුන් විසින් හානි කරමින් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පැවතුණි.

(ඈ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ රු.174,197,923 ක් වටිනා සතුන්, සත්ත්ව ආහාර , සත්ත්ව විටමින් හා ඖෂධ පෞද්ගලික ආයතන දෙකකින් දෙපාර්තමේන්තුවට මිලදී ගෙන තිබුණි. එම පෞද්ගලික ආයතන දෙක පහත සඳහන් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(i) 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතට අනුව සත්ත්ව ආහාර ආනයනය කර බෙදාහැරීම සහ විකිණීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් වාර්ෂිකව ලබා ගත යුතු බලපත්‍ර.

(ii) 1982 අංක 29 දරන සත්ත්ව රෝග පනතට අනුව පශු ඖෂධ ආනයනය සඳහා පශු ඖෂධ ආයතනය විසින් ලබාගත යුතු බලපත්‍රය. (එහි වලංගු කාලය වසර 3 කි.)

(iii) සත්වයින් ආනයනය සම්බන්ධයෙන් සියළුම ආනයනකරුවන් සත්ත්ව රෝග පනත යටතේ සෑම ආනයනයක් සඳහාම සත්ත්ව නිෂ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙතින් ලබාගත යුතු පූර්ණ අවසර පත්‍රය

(ඉ) පොලිස් දෙපාර්තමේන්තුවේ අශ්වාරෝහක කොට්ඨාශයට අයත් රු.60,232,873 ක් වටිනා නිල අශ්වයින් 31 දෙනෙකු 2011 වර්ෂයේ සිට 2016 මැයි 29 දින දක්වා වර්ෂ 5 ½ ක කාල පරාසය තුළදී මිය ගොස් තිබුණි. එයින් අශ්වයින් 25 දෙනෙකු මිලදී ගැනීමෙන් පසු ඉතාම අඩු කාල සීමාවක් ජීවත්ව සිට මිය ගොස් තිබුණි. එලෙස මිය ගිය අසුන් වැඩි ප්‍රමාණයක් ආහාර මාර්ගයේ හෝ ආහාර ජීරණ පද්ධතියේ හෝ ආමාශගත ආසාධන තත්ත්වයකින් හෝ මිය ගිය බව අශ්වයින්ගේ පශ්වාත් මරණ පරීක්ෂණ පිළිබඳව පශු වෛද්‍ය වාර්තාවලට අනුව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් "කොළඹ 11, පිටකොටුව ප්‍රදේශයේ පොලිස් අශ්වාරෝහක කොට්ඨාශයෙහි පිහිටා ඇති බැවින්, එය ලංකාවේ ශබ්ද දූෂණය, පරිසර දූෂණය ඉතා වැඩි නගරයක් බැවින් හා එය අශ්වයින්ගේ පැවැත්මට හිතකර නොවන බව ස්ථානයක් බවට පශු වෛද්‍යවරු උපදෙස් ලබා දී ඇති බැවින්, මේ සඳහා හොරණ ප්‍රදේශයේ අක්කර 50 ක පමණ භූමියක් වෙන්කර ඇත. ඉදිරියේ දී එම ස්ථානයට මෙම අසුන් හා ස්ථාල රැගෙන යාමට කටයුතු කිරීමෙන් අශ්වයින්ගේ හොඳ ශරීර

සෞඛ්‍ය තත්ත්වයක් ඇති කිරිමටත්, එම ස්ථානයේ අසුන් අභිජනනය කිරිම මගින් පොලිස් අශ්වාරෝහක කොට්ඨාශයට අශ්වයින් ලබා ගැනීමට ද සැලසුම් කොට ඇත " යනුවෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) මා වෙත දන්වා තිබුණි.

**3.11 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දූර්වලතා**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** කාන්තා පොලිස් නිලධාරිනියක් විසින් ව්‍යාජ ලිපිනයක් සඳහන් කරමින් තනි පුද්ගල ව්‍යාපාරයක් 2010 වර්ෂයේදී ආරම්භ කර ලී බඩු උපකරණ පොලිස් දෙපාර්තමේන්තුවට සපයා තිබුණි. නියැදි පරීක්ෂණවලට අනුව 2011 වර්ෂයේදී එම ව්‍යාපාරයෙන් අවස්ථා 06 කදී එකතුව රු.284,525 ක ගෘහ භාණ්ඩ දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන තිබුණි.

(ආ) ඉහත නිලධාරිනියගේ ව්‍යාපාරික නාමයම භාවිතා කරමින් 2011 වර්ෂයේදී බාහිර පුද්ගලයෙකු විසින් ව්‍යාජ ලිපිනයක් සඳහන් කර තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර තිබුණි. නියැදි විගණන පරික්ෂාවලදී අනාවරණය වූ පරිදි මෙම ව්‍යාපාරය විසින්ද අවස්ථා 12 කදී ව්‍යාජ ලිපිනයන් 04 ක් සඳහන් ලිපි ශීර්ෂ භාවිතා කරමින් එකතුව රු.2,801,992 ක් වටිනා ගෘහ භාණ්ඩ පොලිස් දෙපාර්තමේන්තුවට සපයා තිබුණි.

(ඇ) ඉහත සඳහන් බාහිර සැපයුම්කරු පසුව ව්‍යාජ ලිපිනයක් සඳහන් කර තවත් ව්‍යාපාර නාමයකින් තනි පුද්ගල ව්‍යාපාරයක් 2011 ඔක්තෝබර් 12 දින පිහිටුවා තිබුණි. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි අවස්ථා 04 කදී මෙම ව්‍යාජ ව්‍යාපාර නාම 02 ක එකම සැපයුම්කරු විසින් මිල ගණන් ඉදිරිපත්කර තිබූ අතර, ඉන් අවස්ථා 03 කදී එකතුව රු.1,284,350 ක ගෘහ භාණ්ඩ දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන තිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 878 | 531 | 347 |
| (ii) | තෘතීයික මට්ටම | 4,644 | 3570 | 1074 |
| (iii) | ද්වීතීක මට්ටම | 98,764 | 83,555 | 15,209 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,521 | 1952 | 569 |
| | **එකතුව** | **106,807** | **89,608** | **17,199** |